# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/4 – 2018 සැප්තැම්බර් 03 වැනි සඳුදා – 2018.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

2018 අංක .... දරන දකුණු පළාතේ බදු උකස්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් විෂය භාර අමාත්‍ය ගුණතිලක්‍ෂ වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මම මෙහි පළකරනු ලබන 2018 අංක ....... දරන දකුණු පළාතේ බදු උකස්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්ති කෙටුම්පත මෙම ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ සිට සති දෙකක් ඉකුත්වීමෙන් පසු දකුණු පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු හෝ සංශෝධන ඇත්නම් එම කරුණු හෝ සංශෝධන එම කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ හැක.

ගුණතිලක්‍ෂ වඩු ෂාන් විජයලාල් ද සිල්වා,  
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන,  
නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා  
දේශීය වෛද්‍ය, සංචාරක හා ඉංජිනේරු සේවා අමාත්‍ය.

2018 අගෝස්තු මස 29 වැනි දින,  
ගාල්ල.  
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**2018 අංක ......... දරන දකුණු පළාතේ බඩු උකසගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

01. මේ ප්‍රඥප්තිය 2018 අංක .... දරන දකුණු පළාතේ බඩු උකසගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

අනුකූල වේ යන වචනය ඉවත්කොට අනනුකූල වේ යනුවෙන් සංශෝධනය කිරීම

02. 2013 අංක 01 දරන දකුණු පළාතේ බඩු උගස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ පළමු පිටුවේ සඳහන් ''මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1942 අංක 13 දරන බඩු උගස්ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූල වේ''. යන වචනය ඉවත්කොට ''අනනුකූල වේ'' යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

03. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 11 (1 ) වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

11 (1) උකස් ව්‍යාපාර තැන්පතු මුදල මත උද්ගතවන යම් පොළියක් වේ නම් එම මුදල පළාත් සභා අරමුදලට බැරවිය යුතුය.

අනුකූලතාවයන් ඇති වූ විට සිංහල නාමය බලපැවැත්විය යුතු බව

04. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වූ විටෙක සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය.

09 - 421

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.